# මහනුවර නගරයේ සංචාරක ප්‍රවණතා

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඩබ්ලිව්.පී.එන්. පී. ජයරත්න[1]**

**නිලන්ති බණ්ඩාර[2]**

**සංක්ෂේපය**

මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස 1988 වර්ෂයේ දී පත් කිරීමටත් පෙර සිට ම දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට නොමදව ලක් වූ ස්ථානයකි. මෙම පර්යේෂණය මඟින් සංචාරක කර්මාන්තය තුළ ලෝක උරුම නගරයක් වශයෙන් අනෙකුත් සංස්කෘතික නගරවලට  සාපේක්ෂව සංචාරක කර්මාන්තයේ වර්ධනයක් තිබේද යන්න සොයා බැලේ. ප්‍රධාන අරමුණ ලෙස ලෝක උරුම නගරයක් ලෙස සංචාරක ව්‍යාපාරය තුළ වැදගත්කමක් හිමි වී තිබීමත් අනු අරමුණ ලෙස සංාචාරකයන් පැමිණීමේ අරමුණු, ප්‍රධානතම සංචාරක ආකර්ෂණ හා ප්‍රවණතා හඳුනා ගැනීම, සංචාරක ව්‍යාපාරය තුළින් මහනුවරට එල්ල වී ඇති බලපෑම් හඳුනා ගැනීම කෙරෙහි මූලික අවධානය යොමු වේ. මෙහිදී ප්‍රාථමික ද්විතීයික මූලාශ්‍රයන් පරිශීලනය කරමින් කරුණු ගොනු කරනු ලැබූ අතර මහනුවර නගරයේ සියලුම සංචාරක ස්ථාන නියෝජනය වන පරිදි දළදා මාලිගයට පැමිණෙන දේශීය සංචාරකයන් තිස්දෙනෙක් සහ විදේශීය සංචාරකයන් විසිදෙනෙක් නියදිය වශයෙන් තෝරා ගෙන ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර දත්ත ලබා ගන්නා ලදී. වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ඔවුන්ගේ පොත්පත් වලින් තොරතුරු ලබා ගන්නා ලදී. නිරීක්ෂණ ක්‍රමවේද වශයෙන් සති අන්ත දිනවල සංචාරක ස්ථානවලට පැමිණෙන සංචාරකයන්ගේ  හැසිරීම නිරීක්ෂණය කරන ලදී. මේ ආකාරයට දත්ත රැස් කිරීමෙන් අරමුණු ඉටු කර ගන්නා ලදී. මෙම නිබන්ධය මඟින් මහනුවර නගරයේ ඓතිහාසික පසුබිම පිළිබඳවත් මහනුවර ලෝක උරුම නගරය පිළිබඳවත් මහනුවර දිස්ත්‍රික්කයේ සංචාරක ආකර්ෂණය පිළිබඳවත් අධ්‍යයනය සිදු කරනු ලැබීය. එමෙන්ම දේශීය හා විදේශීය සංචාරක කර්මාන්තය පිළිබඳවත් මහනුවර නගරයේ දෙස් විදෙස් සංචාරක කර්මාන්තය පිළිබඳවත් මෙහිදී අවධානය යොමු විය. මෙම තොරතුරුවලට අමතරව සංචාරක ව්‍යාපාරය මඟින් මහනුවර නගරයට එල්ල වී ඇති බලපෑම් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබූ අතර එම බලපෑම් මඟ හරවා ගනිමින් සංචාරක ව්‍යාපාරය නගරය තුළ වර්ධනයට යෝජනා මෙන් ම නව සංචාරක ප්‍රවණතා මොනවාද යන්නද මෙමඟින් ඉදිරිපත් කරනු ලැබීය.

**ප්‍රමුඛ පද-** . මහනුවර නගරය, සංචාරක කර්මාන්තය, උරුම නගරය, සංචාරක ආකර්ෂණ, ප්‍රවණතා

[1] පුරාවිද්‍යා විශේෂවේදී අවසන් වසර, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nadeekajayarathne02@gmail.com
[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය